2026 JULY 21
LANKAYOUTH Chat
Since : 2011
www.lankayouth.lk

# එකම රාමුවකට කොටු නොවී කලාවේ සීමා බිඳින තරුණ නිර්මාණකරුවා

## නිපුන් දුලාංජන වික්‍රමසිංහ





කලාව එකම රාමුවකට සීමා නොකර, චිත්‍ර කලාව, ඡායාරූපකරණය, ග්‍රැෆික් නිර්මාණකරණය, සංගීතය සහ වීඩියෝ නිර්මාණය වැනි විවිධ ක්ෂේත්‍ර රැසක තම හැකියාවන් ඔප්නංවාගෙන යන තරුණ නිර්මාණශීලියෙකි නිපුන් දුලාංජන වික්‍රමසිංහ. නව අදහස් සහ වෙනස් දෘෂ්ටිකෝණයක් ඔස්සේ සිය නිර්මාණ ගොඩනගන ඔහු, දේශීය මෙන්ම ජාත්‍යන්තර මට්ටමේ නිර්මාණවලටද දායක වී ඇති දක්ෂ කලාකරුවෙකි.

**• මුලින්ම නිපුන් ගැන කෙටියෙන් කිව්වොත් ?**

මගෙ නම නිපුන් දුලාංජන වික්‍රමසිංහ . මගෙ පවුලේ අම්මයි තාත්තයි අක්කයි ඉන්නෙ..

**• ඔබේ මේ හැකියාව උපතින්ම රැගෙන ආ දෙයක්ද? ඔබේ පවුලේ අය කලාවට සම්බන්ධයි ද ?**

ඔව් අනිවාර්යයෙන්ම.. තාත්තා ගොඩක් කලාවට ලැදි කෙනෙක්. අක්කත් එහෙමම තමයි. මාත් පොඩි කාලෙ ඉදන් හැමදේම වෙනස්ම කෝණයකින් දකින්න පුරුදු වුණේ ඒ නිසා කියල මං විශ්වාස කරනවා. හැබැයි මම යන පාත් එක එයාලට වඩා ටිකක් වෙනස්. මම එක රාමුවකට කොටු වුණ කෙනෙක් නෙමෙයි. කලාව ගත්තම පැති ගොඩක් තියෙනව. උදාහරණයක් විදිහට ගත්තම චිත්‍ර කලාව ගත්තම මම චිත්‍ර කලාව උසස් අධ්‍යාපනයටත් හැදෑරීම් කළේ.. නමුත් මට ඕනෙ ඒක විතරක් කරන්න නෙමෙයි. ඒකට අදාල හැමදේම කරන්න ඕනෙ. මම ජායාරූප ශිල්පිය හදාරනව 2018 ඉදන්.. දැන් මම වෘත්තීය වශයෙන් එය කරගන යනවා .ඒකට මට චිත්‍ර කලාවෙන් ඉගෙන ගත්ත දැනුම ලොකු රුකුලක් වුණා .මං චිත්‍ර වලින් පස්සෙ මුලින්ම යොමු වුණේ ග්‍රැෆික් ඩිසයිනින් කරන්න. මේ හැම ක්ෂේත්‍රයක්ම එකකට එකක් සම්බන්ධයි. සමහර දේවල් හැර.

**• දිගටම මේ ක්ෂේත්‍රයේ රැඳෙන්න කැමති ද?**

ඇත්තටම මම එක ක්ෂේත්‍රයක රැදිලා ඉන්න කැමති නෑ.. මට ඕනෙ අවසාන හුස්ම වෙනකන් හැමදේම ඉගෙනගන්න. සමහර වෙලාවට කෙනෙක්ට හිතෙන්න පුළුවන් මං කරන පෙලක් වැඩ අනිත් වැඩ එක්ක අහසයි පොළොවයි වගේ කියල. ඒත් ඒ දැනුම තමයි අපි අපිව උස්සලා තියන්න පුලුවන් එකම ධනය.
ඒ නිසා මම මැරෙනකන්ම හැම ක්ෂේත්‍රයක්ම ඉගෙනගන්නවා.

**• ගෙදරින් ලැබෙන සහයෝගය?**

ගෙදරින් මම කරන කිසිම දේකට අකුල් හෙලන්නෙ නැති එක තමයි මට ලැබෙන ලොකුම සහයෝගය. අක්කා තමයි මාව මුලින්ම ග්‍රැෆික් ඩිසයිනින් ක්ෂේත්‍රයට යොමු කරේ.මං කොහොම හරි ළඟ ළඟ වෙනස් වැඩ ටිකක් කරනවා.

**• අනාගත බලාපොරොත්තු,?**

මගෙම කියලා ප්‍රොඩක්ෂන් එකක් කරන්න බලාපොරොත්තු වෙනවා. ස්ටුඩියෝ පැත්තත් කවර් වෙන විදිහට. ඒක ජායාරූප සම්බන්ධව විතරක් නෙමෙයි. Sound Recording" Music Productions, Graphic designs, Photography වගේ හැමදේම කරනවා. මගේ වැඩවලට විශ්වාසවන්ත ශක්තිමත් staff එකක් හදන්න බලාපොරොත්තු වෙනවා.



**• ඉදිරි නිර්මාණ කටයුතු ?**

Music Video එකක් වෙනවා.. ඒක මේ අවුරුද්ද ඇතුලත රිලීස් කරනවා. ජායාරූපකරණයෙන් වැඩ ගොඩක් එන්න තියෙනවා. කෙටි චිත්‍රපට ගොඩක් හැදෙනවා.. තව මම කරන වැඩ ඔයාලත් එක්ක බෙදාගන්න අලුත් යූටියුබ් චැනල් එකක් ඉදිරියට බලාගන්න පුළුවන් වෙවී.

**• ඔබ රැප් කලාවට දක්ෂයෙක් . ඔබේ හැකියාව අන්තර්ජාතික මට්ටමකට ගෙනියන්න අවස්ථාව ලැබුණා කියන්නේ ඇත්තක් ද ?**

ඔව්.. මම විදේශිකයන් සමගද ගීත නිර්මාණය කරලා තියෙනවා..

**• ඒ නිර්මාණය ගැනත් දැන ගන්න කැමතියි?**

මට 2020දි Social Media ඔස්සේ දකුණු අප්‍රිකානු මිතුරෙක් මුණගැහෙනව. ඔහු සමග මුල් ගීතය කරන්න අපි කතා කරගෙන එකඟතාවයකට එනව. එය ඔහු ඔහුගේ රටේ ඉදන් පටිගතකරලා එවනවා මට. මෙහෙ තමයි ඉතුරු වැඩ සියල්ල Plan කරන්නෙ මම. Mp3 එක කරලා අපි රටවල් දෙකේ සිට වීඩියෝ එකත් කරනවා. අවසානෙ හොඳ නිර්මාණයක් බිහිවෙනව. ඔහු එය Live Concert වලදීද Perform කර රසිකයින් ලොකු පිරිසකගේ ඇගයීමට ලක් වුණා. මම ආසාවෙන්ම Featuring කරපු වැඩක් ඒක.

**• මේ ගමන එන්න උදව් කරපු අය ඇති ?**

ඔව්. අම්මා තාත්තා, අක්කා.. එයාගෙ හස්බන්ඩ්, යාලුවො, මට ගොඩක් උදව් කරලා තියෙනවා.. ඒ හැමෝම මතක් කරන්න කැමතියි.

**• යෞවනයේ ඉන්න නිසා ආදරය ගැන කතා නොකරත් බැහැ නේද?**

දැන්නම් මං කිසිම කෙනෙකුගෙ ආදරයක් දකින්නෙ නෑ. හැමකෙනාම මොකක්ම හරි කොන්දේසියකට ආදරෙයි වගේ රඟපානවා විතරයි..

**• ආදරවන්තියක් ඉන්නවද?**

දැන් නෑ..

TEXT ස්ටෙෆනි කොතලාවල
Layout ලංකායූත්

මෙවැනි ලිපියක් ලංකායූත් වෙබ් අඩවියේ පළකර ගැනීමට 0718548549 අංකයට කතා කරන්න.